# කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා කජු සංස්ථාව

# පුරප්පාඩු

ශ්‍රී ලංකා කජු සංස්ථාවේ පහත සඳහන් තනතුරුවල පුරප්පාඩු සඳහා සුදුසුකම්ලත් අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත් කළමනාකරණ හා පාලන) (MM 1-1) - තනතුරු 01

- **බාහිර අයදුම්කරුවන් සඳහා සුදුසුකම් :-**

1. කළමනාකරණ, වාණිජ හෝ මානව සම්පත් කළමනාකරණය යන විෂය ක්ෂේත්‍රයකින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.

සහ

හා උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්දක් ලබා තිබීම.

- **අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සුදුසුකම් :- (පහත 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. "කනිෂ්ඨ කළමනාකාර" (JM) සේවා ගණයෙහි II ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

➢ වයස : අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.
අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

➢ වැටුප් පරිමාණය : රු.53,175/= - 1,375 x 10, - 1,910 x 15 - රු.95,575/=

## 02. සහකාර සාමාන්‍යාධිකාරී (ප්‍රතිපත්ති හා සැලසුම්) (MM 1-1) - තනතුරු 01

- **බාහිර අයදුම්කරුවන් සඳහා සුදුසුකම් :-**

1. කෘෂිකර්ම හා කෘෂිකර්ම විෂය ක්ෂේත්‍රයට අදාළ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම හා උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්දක් ලබා තිබීම.

- **අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සුදුසුකම් :- (පහත 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. "කනිෂ්ඨ කළමනාකාර" (JM) සේවා ගණයෙහි II ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

➢ වයස : අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.
අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

➢ වැටුප් පරිමාණය : රු.53,175/= - 1,375 x 10, - 1,910 x 15 - රු.95,575/=

## 03. ප්‍රාදේශීය කළමනාකරු/සහකාර ප්‍රාදේශීය කළමනාකරු (JM 1-1) - තනතුරු 02

- **බාහිර අයදුම්කරුවන් සඳහා සුදුසුකම් :- (පහත 1 හෝ 2 )**

1. කෘෂිකර්මය, කළමනාකරණ, අලෙවිකරණය යන විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත් වීම.

- **අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සුදුසුකම් :- (පහත 1 හෝ 2 හෝ 3)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (MA 1-1) සේවා ගණයෙහි II වන ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහක ( 05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
3. තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සම්බන්ධයෙන් වන විට,

කළමනාකරණ සහකාර - තාක්ෂණික (MA 2-1) සේවා ගණයෙහි II ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

➢ වයස : අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.
අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපායි.

➢ වැටුප් පරිමාණය : රු.42,600/= - 755 x 10, - 1,135 x 18 - රු.70,580/=

❖ **ඉහතින් සඳහන් කර ඇති සුදුසුකම්වලට අමතරව සෑම තනතුරක් සඳහාම ඉල්ලුම්කරන සෑම අයදුම්කරුවෙක් ම,**

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන් ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.
iii. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

උක්ත තනතුරු සඳහා ඔබ විසින් සකස් කරන ලද අයදුම්පත් සහතිකවල පිටපත්ද සහිතව පහත සඳහන් ලිපිනයට 2024.05.08. දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් එවිය යුතුය. ඔබ විසින් ඉල්ලුම් කරන තනතුර ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.

**සභාපති,**
**ශ්‍රී ලංකා කජු සංස්ථාව,**
**නො.1334, පරණ කෝට්ටේ පාර,**
**රාජගිරිය.**